# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


අංක 2343/27 - 2023 අගෝස්තු මස 02 වැනි බදාදා - 2023.08.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවින්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර* :

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහගල්බොඩ මෙගොඩ කෝරලේ සුළු කොට්ඨාසයේ, අංක 725 නාරම්පොල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, තෝරයාය ගමේ පිහිටි, සර්වේ ජනරාල්ගේ කැඩැස්තර සිතියම් අංක 420214 කලාප අංක 01 හා 2022.08.31 දිනැති පත්‍ර අංක 11 හි කැබලි අංක 235 සහ 236 (කැබලි 2ක්) වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0197 ක් පමණ වූ පහත විස්තර සඳහන් ඉඩම් කැබලි:

01. **කැබලි අංක 235**

ඉඩමේ නම : —; ඉඩමේ විස්තරය : දැදුරුඔය; හිමිකම් කියන අය : රජය; මුල් හිමිකම් කියන අය : 1 වැනි බිම් කැබැල්ලේ කොටසක්. ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38(අ) වගන්තිය යටතේ පවරා ගන්නා ලදී. මුල් හිමිකම් පාන්නා : කුමාරපේලි ආරච්චිගේ ස්ටීවන් - දැදුරුඔය ජල සම්පාදන ව්‍යාපෘතියේ ජල මූලාශ්‍රයේ ආරක්ෂාව සඳහා අවශ්‍ය වී ඇත; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0160

02. **කැබලි අංක 236**

ඉඩමේ නම : කෝන්ගහමුලවත්ත සහ අස්ලියද්ද; ඉඩමේ විස්තරය : ලඳු කැලය; හිමිකම් කියන අය : රජය; මුල් හිමිකම් කියන අය : 189 වැනි බිම් කැබැල්ලේ කොටසක්. ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38(අ) වගන්තිය යටතේ පවරා ගන්නා ලදී. මුල් හිමිකම් පාන්නා : කුමාරපේලි ආරච්චිගේ ස්ටීවන් - දැදුරුඔය ජල සම්පාදන ව්‍යාපෘතියේ ජල මූලාශ්‍රයේ ආරක්ෂාව සඳහා අවශ්‍ය වී ඇත; ප්‍රමාණය : හෙක්ටයාර් 0.0037

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ **2023.10.16** වැනි දින **පෙ.ව. 10.00** ට මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2023.10.02 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල සහ ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

එන්.ඒ.ඒ.එස්. ප්‍රියංකර,
ප්‍රාදේශීය ලේකම්,
මල්ලවපිටිය.

2023 ජූලි මස 28 වැනි දින,
මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 08 - 0019




ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.